# වගා සටනට එක් වූ ශ්‍රමදානයක්

මුළු ජාතියම වගා සටනක පෙරමුණෙහි ගමන් ගන්නා මේ යුගයේදී රජයේ ගොවිපල් විසින් ජනතා සහයෝගය ලබා ගනිමින් වැඩි අස්වනු ලැබීමේ උත්සාහයක යෙදුනොත් එයද මේ සටනින් ජය ලැබීමට රුකුලක් වනු ඇත.

මෙම අදහස පෙරදැරිකර ගෙන සංවිධානය කරන ලද මහා ශ්‍රමදාන උළෙලකට සහභාගි වීමේ අවස්ථාව පසුගියදා අපට ලැබුණි.

ගාලු දිසාවේ පෝද්දල නරාවල රජයේ බිත්තර වී ගොවිපලේදී 1973 සැප්තැම්බර් මස 30 දා මෙම ශ්‍රමදානය පවත්වන ලදී. අක්කර 35 ක වපසරියකින් යුත් මේ ගොවිපළ අරඹන ලද්දේ 1960 ජනවාරි මසදීය. එතැන් සිට මේ දක්වා බිත්තර වී නිපදවීමේ ගොවිපළක් හැටියට කටයුතු කල ද අවට ගම්වාසීන් හා පැසැල් සිසුන් ද සහභාගි කර ගනිමින් මෙවන් ශ්‍රමදානයක් පැවැත්වීම වැදගත් සිද්ධියකි.

ගොවිපලේ කාර්‍යභාර නිලධාරි වි. ක. ද. සි. විතාරණ මහතා විසින් නරාවල මහ විදුහල්පති තුමාත් ගම්සභාපති තුමාත්, ඇතුළු සංවිධායක මංඩලයක සහයෝගයෙන් සංවිධානය කරන ලද මෙම ශ්‍රමදානයේ ප්‍රධාන අරමුණ වූයේ ගොවිපල තුල නවීන ක්‍රමයට ගොයම් පැල සිටුවීම හා ඇළක් කැපීමයි. "මෙසේ ක්‍රමානුකූලව පැළ සිටුවා ඊට අදාළ වෙනත් දියුණු ගොවිතැන් ක්‍රමද අනුගමනය කර ගොවිතැන් කිරීමේ වැඩ පිළිවෙලට අවට ජනතාව සහභාගි කරවා ගැනීමෙන් බලාපොරොත්තු වන්නේ ගොවිපලේ අස්වැන්න වැඩි කර ගැනීමට මෙන්ම අවට ගොවීන්ගේ අස්වැන්න නංවා ගැනීමට ද, අවස්ථාවක් සලසා දීමයයි" ද ගොවිපලේ කා. භා.නි. විතාරණ මහතා පැවසීය. සැබවින්ම එය කාලෝචිත වූත්, වැදගත් වූත්, අදහසක් බැව් ශ්‍රමදානයට සහභාගිවූ අපටද පැහැදිළි විය.

අපේ පැරණි ගොවි සංස්කෘතිය අනුව හැඩ ගැසුණු ජාතික සිරිත් විරිත් වලට මුල් තැනක් දීම මෙම ශ්‍රමදානයේ තවත් වැදගත් සිද්ධියක් විය. ආගමික වතාවත් කර ජාතික කොඩිය කුඹුරේ සිටුවා නැකතට වැඩ ඇරඹීම දක්නට ලැබුණි.



ගාලු දිසාපති ඩබ්.ජේ. ප්‍රනාන්දු මහතාගේ ප්‍රධානත්වයෙන් ආගමික වතාවත් ඇරඹෙයි. කෘ. නි. (ගො. පා. හා නි.) ජයකොඩි මහතාත් ගොවිපලේ කා.භා.නි. විතාරණ මහතාත් පසෙකින් වෙති.

←

ශ්‍රමදානයට සහභාගි වූ විශේෂ අමුත්තන් අතර ගාලු මහ දිසාපතී ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු, ගාල්ලේ දි. කෘ. ව්‍යා. නි., ඇල්. පී. පී. ද සොයිසා, මාතර, කෘ. නි. (ගො. පා. භා. නි.) ඩී. බී. ජයකොඩි, පරිපාලන නිලධාරි, එච් .එස්. සමරවීර, ගම්සභාපති, විජයබන්දු කහදූව, ගොඩනැගිලි හා වාරිමාර්ග ඉංජිනේරු, උපාලි දෙල්පවිත්‍ර, ප්‍රා. ආ. නි., ඒ. සී. ඩබ්. පෙරේරා, නාරාවල මහ විදුහල්පති, කේ. එච්. සමරවර්ධන, ලබුදූව, ගොවිපල කළමනාකාර, ආර්. සී. සෙනෙවිරත්න, ගො. උ. විජේවික්‍රම යන මහත්වරුද වූහ.



ගොවිපලේ කෘ. භා. නි. විතාරණ මහතා ශ්‍රමදනය ආරම්භයේ පැවති රැස්වීම අමතයි.

→



රජයේ නිලධාරීන්, පාසැල් සිසු-සිසුවියන් හා ගොවි මහතුන් කුඹුරට බැස පැල සිටුවද්දී.
→

ශ්‍රමදානය ආරම්භයේදී පැවති උත්සවයේදී කථාකළ ගාලු දිසාපති, ඩබ්ලිව්. ජේ. ප්‍රනාන්දු මහතා “කවුරුත් වගා යුද්ධයකට සටන් වදින මේ අවස්ථාවේදී මෙවැනි ශ්‍රමදාන වලින් මහඟු සේවයක් ඉටු කළ හැකි බැව්” සඳහන් කළේය.



ඇල කැපීමේ ශ්‍රමදනය ඇරඹෙයි. දිසාපති ඩබ්. ජේ. ප්‍රනාන්දු මහතා යමක් ගැන උපදෙස් දෙයි.
←


3—ජ 02893 (11, 73)

ශ්‍රමදානයට නාරාවිල මහා විද්‍යාලයේ ශිෂ්‍ය, ශිෂ්‍යාවන් 600 ක් පමණද අවට වැසියන් 200 ක් පමණ ද සහභාගි වූ අතර, අක්කර 5 ක් පමණ පොක්කාලි වර්ගයේ ගොයම් පැළ උදුරා සිටුවන ලදී. පාසැල්වල කෘෂිකර්මය අනිවාර්ය විෂයයක් බවට පත් කර ඇති මේ අවධියේදී පාසැල් සිසුන්ට මෙවැනි ශ්‍රමදානවලට සහභාගි වීමෙන් ලද හැක්කේ විශාල අත්දැකීමක් හා පුහුණුවකි.



පාසැල් සිසුන් ගොයම් පැල සිටවද්දී

ශ්‍රමදානයේ තවත් වැදගත් තැනක් ගත්තේ ගොවිපලට පමණක් නොව අවට කුඹුරු යායන්ටද ප්‍රයෝජනවත් වූ ඇළක් කැපීමයි. ගොවිපල ඔස්සේ හෝලුවාගොඩ ගඟ දක්වා සැතපුම් 1½ ක් පමණ දුර කපන ලද මේ ඇළ කුඹුරුවල වැඩි ජලය බැස යාමට සැලැස්වීමටත් ගංවතුර උවදුරුවලක්වා ගැනීමටත් උපකාරි වනු ඇත. මෙම ඇළ කැපීමේ ශ්‍රමදානයට ගොවිපලේ සේවකයින් හා අවට ගම්වාසීන් ඇතුළු 200 ක් පමණ පිරිසක් සහභාගි වූහ.

ශ්‍රමදානය ආරම්භයේදී මෙන්ම අවසානයේදීද සංවිධායක කොමිටිය විසින් ඊට සහභාගි වූවන්ට ආහාර පානාදියෙන් සංග්‍රහ කරන ලදී.

ජාතික සිරිතට විරිතට මුල් තැන දෙමින් පාසැල් සිසුන් හා ගම්වාසීන්ද සහභාගි කරවා ගෙන රජයේ ගොවිපළක මෙවැනි ශ්‍රමදානයන් ඉතාමත් සාර්ථක ලෙස පැවැත්වීමෙන් අපේ ජාතික වගා සටනට ලැබෙනුයේ බලවත් දිරිගැන්වීමකි.